කාන්තාව, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කොට ගනිමින් කොන් නොකරන, ඒකාකෘතික නොකරන මාධ්‍ය භාවිතාවක් අපට අවශ්‍ය නොවන්නේද යන කරුණ Ethics Eye ඔස්සේ බොහෝ විට සාකච්ඡාවට පාත්‍ර වී ඇත.

නීති විරෝධී ලෙස හක් බෙල්ලන් තොගයක් නිවසක සඟවා තබා ගෙන සිටි පිරිසක් පොලිස් අත්අඩංගුවට පත්වීමේ පුවතක් මාධ්‍ය තුළ වාර්තා වී තිබූ අයුරු මෙහිදී නිදසුනක් ලෙසින් දැක්විය හැක.

මෙම පුවත වාර්තා කරන දිනමිණ හා දිවයින පුවත් වාර්තාවන් (ජනවාරි 18, 2024) දෙකෙහිම සිරස්තල තුළ සහ අන්තර්ගතයන් තුළ මේ සම්බන්ධයෙන් දැක්වී තිබුණේ මෙසේය,

* "කතක ඇතුළු තිදෙනෙක්", "කාන්තාවක් ඇතුළු තිදෙනෙකු"

මෙම පුවත් වාර්තාවන් තුළ,

1) තිදෙනෙකු අත්අඩංගුවට පත්ව ඇති මොහොතක, අත්අඩංගුවට පත්වූ කාන්තාව පමණක් ඉස්මතු කොට දක්වන්නේ, මෙම වරදේ වැඩි වගකීමක් කාන්තාවට පැවරෙන බවක් පෙන්වීමට ද? එසේ නොවේ නම්, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයෙන් කාන්තාව පමණක් සෘණාත්මකව ඉස්මතු කොට දැක්වීමේ පදනම කුමක්ද?

2) මෙම දිවයින හා දිනමිණ පුවත් වාර්තාවන් මඟින්, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමට ලක් නොකරන්නේ ද?

